**දකුණු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය - 2017**

---

දකුණු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2014 මැයි 27 දින එළඹි අංක 3027 - එස්ආර්අයි දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.05 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. දකුණු අධිවේගයට සම්බන්ධවන කිලෝමීටර් 33 ක මාර්ග පුනරුත්ථාපනය හා යාවත්කාලීන කිරීම තුලින් ජාතික ප්‍රවාහන කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 12,248 කට සමාන එජඩො මිලියන 95 ක් වන අතර, එම මුදලින් රු.මිලියන 9,025 කට සමාන එජඩො මිලියන 70 ක් සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 මැයි 27 දින ආරම්භ කළ අතර, 2018 දෙසැම්බර් 30 දින වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුලත්වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දැ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුලත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කල මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වියදම සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ දායකත්ව නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය වලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව්කර තිබුණේද යන බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(ඒ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්වාගණනය කල විගණන මතය සඳහා පදනම**

**-----------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**2.1 මතය**

**------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇතිවන බලපෑම් හැර මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව්කර තිබුණේද යන බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමෙහි නියමකර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------------

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් මස ඉදිරිපත් කරන ලද අතුරු ගෙවීම් සහතිකවලින් අයකරගත් රු. මිලියන 41.5 ක පූර්ව අත්තිකාරම් මුදල් මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි.

(ආ) අතුරු ගෙවීම් සහතික වලින් අඩුකරන ලද රු. මිලියන 20.5 ක් වූ රඳවා ගැනීම් හා රු.මිලියන 188.70 ක් වටිනා සහතික කළ වැඩ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල ගිණුම්ගතකර හා ඉදිරිපත්කර නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

--------------------------------------

## 3.1 අරමුදල් උපයෝජනය

-----------------------

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය, සහ සමාලෝචිත වර්ෂය තුල හා 2017 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනයට අදාල වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂයේ අයවැය ඇස්තමේන්තු වේ කරන ලද වෙන් කිරීම් | උපයෝජනය කළ අරමුදල් 2017 වර්ෂය තුල | | 2017 දෙසැම්බර් 31 දින දක්වා | |
|---|---|---|---|---|---|---|---|
| | එ.ජ ඩො. මිලියන | රු. මිලියන | රු. මිලියන | එ.ජ ඩො. මිලියන | රු. මිලියන | එ.ජ ඩොලර් මිලියන | රු. මිලියන |
| ආසියානු සංවර්ධන බැංකුව | 70 | 9,025 | 1,515 | 10.25 | 1,473.52 | 22.04 | 3,222.47 |
| ශ්‍රී ලංකා රජය | 25 | 3,223 | 700 | 4.37 | 633.00 | 20.07 | 2,933.86 |
| | **95** | **12,248** | **2,215** | **14.62** | **2,106.52** | **42.11** | **6,156.33** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉහත තොරතුරු වලට අනුව, ණය ලබා දෙන ආයතනය විසින් ලබා දී ඇති එජඩො මිලියන 70 කට සමාන රු.මිලියන 9,025 ක මුළු වෙන්කිරීම් වලින් සියයට 31 ක ප්‍රතිශතයක් නියෝජනය වන එජඩො මිලියන 22.04 කට සමාන රු.මිලියන 3,222.47 ක් පමණක් ව්‍යාපෘතියේ කටයුතු ආරම්භකර වසර තුන හමාරක් ගත වූ 2017දෙසැම්බර් 31 දිනට උපයෝජනය කර තිබුණි. තවද, ව්‍යාපෘති කාලසීමාව තුල ඉලක්කයන් සපුරාගැනීමට වගකීම් නියම කිරීම සමඟ සම්පූර්ණ ව්‍යාපෘති කාලය ආවරණය වන පරිදි මාසික, කාර්තුමය, අර්ධ වාර්ෂික වශයෙන් මූල්‍ය හා භෞතික ඉලක්කයන් ඉස්මතුවන ලෙස සවිස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර ක්‍රියාත්මක කර නොතිබුණි. එබැවින් වෙන්කරන ලද අරමුදල් උපයෝජනය කිරීමේ ප්‍රගතිය මන්දගාමීව පැවතුණි.

(ආ) ව්‍යාපෘතියේ වැඩසටහන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සවිස්තරාත්මක අයවැයක් සකස් කර නොතිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා රේඛීය අමාත්‍යාංශයේ අයවැය ඇස්තමේන්තුව තුල වෙන් කරන ලද රු.මිලියන 700 ක වෙන්කිරීම් වලින් රු.මිලියන 633 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

## 3.2 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘති ගිවිසුමට අනුව, ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත් පැකේජ 04 ක් යටතේ දක්ෂිණ අධිවේගී මාර්ගයට සම්බන්ධ කිලෝමීටර 33 කින් යුත් මාර්ග 06 ක් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන තිබුණි. මාර්ග ඉදිකිරීමේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රගති වාර්තා අනුව, කොන්ත්‍රාත් පැකේජ 01 යටතේ මොරටුව - පිළියන්දල මාර්ගයේ කිලෝමීටර් 2.50 ක වැඩි දියුණු කිරීමේ කටයුතු සහ රත්මලාන - මිරිහාන මාර්ගයේ කිලෝමීටර් 2.14 ක වැඩි දියුණු කිරීමේ කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විට නිමකර තිබුණි. කෙසේවෙතත්, කොන්ත්‍රාත්කරු විසින් ප්‍රමාණපත්‍රයේ ඇතුලත් රු.මිලියන 134 ක් වටිනා අයිතම 235 ක වැඩ සම්පූර්ණ කර නොතිබුණි. වැඩසටහන් වෙනස්කිරීම හා කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්ය සාධනය හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයේදී අනෙකුත් කොන්ත්‍රාත් පැකේජ 03 යටතේ වූ මාර්ග 04 හි පුනරුත්ථාපන වැඩ සියයට 8 සිට සියයට 61 ක පරාසයක මන්දගාමී ප්‍රගතියක් පෙන්නුම් කෙරිණි.

(ආ) මුළු වෙන්කිරීම් වලින් සියයට 68 ක ප්‍රතිශතයක් නියෝජනය කරමින් රු.මිලියන 87.7 ක් හා රු.මිලියන 44 ක් පිළිවෙලින් ලංකා විදුලිබල මණ්ඩලය සහ ශ්‍රී ලංකා ටෙලිකොම් වෙත ගෙවා තිබුණද කැස්බෑව - පොකුණුවිට මාර්ගයේ විදුලි හා දුරකථන රැහැන් වෙනත් තැනකට ස්ථානගත කිරීමේ වැඩවල මන්දගාමී ප්‍රගතියක් පෙන්නුම් කර තිබුණි. විදුලි කණු සහ විදුලි පරිවර්තක නැවත සවිකිරීමේ වැඩ දින 69 සිට දින 165 ක කාල පරාසයක මන්දගාමී ප්‍රගතියක් වාර්තාකර තිබූ අතර දුරකථන කණු සහ භූවමාරු පෙට්ටි නැවත සවි කිරීමද දින 102 සිට දින 182 ක කාල පරාසයක මන්දගාමී ප්‍රගතියක පැවතුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

ලැබී ඇති තොරතුරු අනුව, ව්‍යාපෘතිය විසින් ජාතික මාර්ග 04 ක පුනරුත්ථාපන වැඩ කොන්ත්‍රාත් පැකේජ 04 ක් යටතේ රු.මිලියන 6,417 ක ඇස්තමේන්තුගත පිරිවැයකට සමාලෝචිත වර්ෂය අවසන් වන විට ප්‍රදානය කර තිබුණි. ආතාත්වික සහ අවිශ්වාසී පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම, ඉදිකිරීම් සැලසුම් වෙනස් කිරීම, සාවද්‍ය සැලසුම්, වැඩබිම් භාරදීමේ ප්‍රමාද, ඉදිකිරීම් ප්‍රමිතයන්ගෙන් බැහැරවීම

වැනි කොන්ත්‍රාත් පරිපාලනයේ දුර්වලතා ඉදිකිරීම් කටයුතුවල දුර්වල කාර්යසාධනය කෙරෙහි ඍජුවම බලපා තිබුණි. මේ සම්බන්ධයෙන් තවදුරටත් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අතාත්වික පිරිවැය ඇස්තමේන්තු හේතුවෙන්, කොන්ත්‍රාත් පැකේජ 01 යටතේ වූ මොරටුව - පිළියන්දල මාර්ගයේ හා රත්මලාන - මිරිහාන මාර්ගයේ පුනරුත්ථාපන වැඩ වලින්, මුල් ප්‍රමාණපතෙහි දක්වා තිබූ විෂය පථය රු.මිලියන 1,322 ක් වටිනා වැඩ පසුව අඩු කර තිබුණි. එමනිසා වැඩ සඳහා නව ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 654 ක් ලෙස තීරණය කර තිබුණි. ප්‍රතිඵලයක් ලෙස, පූර්ව අත්තිකාරම් රු.මිලියන 104 ක් වැඩිපුර කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණු අතර එය වැඩ අවසන් වූ 2017 ජුනි 19 වන දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ආ) කැස්බෑව - පොකුණුවිට මාර්ගයේ සහ කිරුලපන - ගොඩගම මාර්ගයේ පුනරුත්තාපනය හා වැඩි දියුණු කිරීම් සඳහා කොන්ත්‍රාත් පැකේජ 02 යටතේ ප්‍රදානය කළ කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කැස්බෑව - පොකුණුවිට මාර්ගයේ සහ කිරුලපන - ගොඩගම මාර්ගයේ පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම් යටතේ ආරම්භක විෂය පථයේ වූ වැඩ කොන්ත්‍රාත් ගිවිසුමට එළඹීමෙන් පසුව වෙනස්කර තිබුණි. එමනිසා මාර්ගයන්හි සමස්ත දිග කිලෝමීටර් 5.63 කින් අඩු වී ඇති අතර මංතීරුවල දිග කිලෝමීටර් 1.52 කින් අඩු වී ඇත. කෙසේ වෙතත් ඉහත විෂය පථය වෙනස් කිරීම් සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවේ සහ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ව්‍යාපෘතිය විසින් ලබා ගෙන නොතිබුණි.

(ii) 2017 දෙසැම්බර් මස සඳහා වූ ප්‍රගති වාර්තාව අනුව, කොන්ත්‍රාත්කරු ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනයේ අනුමැතිය සඳහා විචලන නියෝග 13 ක් ඉදිරිපත්කර තිබූ අතර එයින් රු.මිලියන 255 ක් වටිනා විචලන නියෝග 07 ක් ව්‍යාපෘති අධ්‍යක්ෂක විසින් අනුමත කර තිබුණි. කොන්ත්‍රාත්තුවේ විෂය පථයෙන් පරිබාහිරව බෝක්කු වැඩි දියුණු කිරීම සඳහා රු.මිලියන 46 ක් වටිනා එවැනි විචලන නියෝග 02 ක් තිබුණු බව නිරීක්ෂණය විය.

(iii) කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම්හි සඳහන් කර ඇති වටිනාකම් විශ්ලේෂණයකින් තොරව අතිරේක පාලම් 05 ක් රු. මිලියන 129.40 ක් වටිනා විචලන නියෝග යටතේ ඉදිකර තිබුණු බව නිරීක්ෂණය විය. එය මුල් ප්‍රමාණපත්‍රයෙහි වටිනාකම් හා සැසඳීමේදී සියයට 23 සිට සියයට 215 දක්වා වඩා වැඩි ප්‍රතිශතයක් සහිත විය.

(iv) කොන්ත්‍රාත්කරුගේ කාර්යයන්හි මන්දගාමී ප්‍රගතිය නොසලකා 2017 නොවැම්බර් මාසයේදී රු. මිලියන 49 ක් තාවකාලිකව මුදල් අත්තිකාරම් ලෙස කොන්ත්‍රාත්කරුට ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) දක්ෂිණ අධිවේගී මාර්ගයේ සිට මාදුරුගොඩ දක්වා මාර්ගයේ පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ආරම්භක ක්‍රියාකාරී සැලැස්මට අනුව, මාර්ගයේ පුනරුත්ථාපන වැඩ 2015 ජූලි මස ආරම්භ කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, එහි කොන්ත්‍රාත්තු 2016 සැප්තැම්බර් මාසයේ දී පිරිනමා තිබුණි. තවදුරටත්, ව්‍යාපෘතිය විසින් ප්‍රමාණපත් පිළියෙල කිරීමට පෙර නිසි විස්තරාත්මක ඉංජිනේරු අධ්‍යයනයක් සිදුකර නොතිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2017 දෙසැම්බර් 31 වැනි දිනට ආරම්භක ප්‍රමාණපතෙහි ඇතුළත් කර ඇති ප්‍රමාණයන් සියයට 05 සිට සියයට 10,429 දක්වා ඉහළ ගොස් තිබුණි.

(ii) ව්‍යාපෘතිය ආරම්භක අදියරේදී පුනරුත්ථාපනය කිරීම සඳහා අවශ්‍ය මාර්ග කොටසේ දිග නිවැරදිව හඳුනාගෙන නොතිබුණි. එමනිසා මාර්ගයේ මීටර් 358 ක අමතර වැඩ ඉහළ වටිනාකම් යටතේ කරගෙන යෑමට පසුව අවසර ලබා දී තිබුණි.

(iii) කොන්ත්‍රාත් ගිවිසුමේ විශේෂ විධිවිධාන බී කාණ්ඩය යටතේ වූ 4.25 උපවගන්තිය අනුව, පොදු උපයෝගී සේවා වෙනත් තැනකට ස්ථානගත කිරීම, ඉවත් කිරීම හා ආරක්ෂා කිරීම

සඳහා කොන්ත්‍රාත්කරු වගකීමට බැඳෙන අතර 2017 දෙසැම්බර් 31 දිනට එම වැඩ දින 28 සිට දින 151 ක කාල පරාසයක ප්‍රමාදයකින් නිමකර තිබුණි. වැඩබිමේ ගල්තාර ඇතිරුම් වැඩ නිම කිරීමෙන් පසුව විදුලි කණු කිහිපයක් විතැන්කර තිබූ බව වැඩබිම් පරීක්ෂාවේදී හෙළිදරව් වූ අතර එයින් මාර්ගයේ වැඩවල ගුණාත්මකභාවයට බලපෑමක් සිදුවේ.

(iv) මාර්ගයේ පාදම් රළු ඇතුරුම්වල ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා කොන්ත්‍රාත්කරු විසින් පාදම් රළු ඇතුරුම් මත තත්ත්ව පරීක්ෂාවන් 56 ක් සිදු කළ යුතු වුවත්, තත්ත්ව පරීක්ෂා 33 ක් පමණක් සිදුකර තිබුණි. මෙයින් පුනරුත්ථාපන වැඩ සඳහා වූ තත්ත්ව සහතික සැලැස්ම කොන්ත්‍රාත්කරු විසින් නිසි පරිදි අනුගමනය නොකරන බව පෙන්නුම් කෙරුණි.

(ඇ) අඹතලේ මාර්ගයේ ඉදිකිරීම් වැඩ පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ආරම්භක අදියරයන්හිදී ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සංස්ථාව විසින් සිදු කරන ලද සමගාමී සංවර්ධන කටයුතු හඳුනාගෙන නොතිබූ අතර ප්‍රතිඵලයක් ලෙස, ආරම්භයේ සැලසුම් කළ මාර්ගයේ පෙලගැස්ම ඉදිකිරීම් ආරම්භකළ දින සිට මාස 04 කට පසුව වෙනස්කර තිබුණි. මීට අමතරව, ව්‍යාපෘතියේ මූලික විෂය පථයට ඇතුලත් වූ කිලෝමීටර් 0 + 000 සිට කිලෝමීටර් 0 + 200 දක්වා වූ මාර්ග කොටසෙහි පුනරුත්ථාපන වැඩ ඉවත් කර තිබුණි.

(ii) වැඩ සැලැස්මට අනුව, නඩත්තු කිරීම සඳහා මාර්ගයේ දෙපස මිලිමීටර් 300 ක් පළල බැම් 02 ක් ඉදිකල යුතු විය. භෞතික පරීක්ෂාවේදී හා මිනුම් කිරීමේදී පැති බැම්වල පළල මිලිමීටර් 280 ත් මිලිමීටර් 290 ත් අතර පැවති බව හෙළිවිය.

**3.4 මූල්‍ය පාලනය පිළිබඳ ගැටළු**

ණය උපයෝජනයේ පවතින මන්දගාමී ප්‍රගතිය හේතුවෙන් රු.මිලියන 92 ක බැඳීම් ගාස්තු ණය ලබා දෙන ආයතනය විසින් අයකරගෙන තිබුණි.

**3.5 ඉඩම් අත්පත් කර ගැනීමේ හා නැවත පදිංචි කිරීමේ කටයුතු**

ලැබී ඇති තොරතුරු අනුව, ඉඩම් අත්පත් කරගැනීමේ හා යළි පදිංචි කිරීමේ කමිටු විසින් ලබා දී ඇති නිර්දේශ මත ව්‍යාපෘතිය විසින් අත්පත්කරගත් ඉඩම් කැබලි 2,069 ක් සඳහා අමතර වන්දි මුදල් රු.මිලියන 782 ක් ඇතුලුව රු.මිලියන 2,818 ක වන්දි මුදලක් 2017 දෙසැම්බර් 31 දිනට නිරවුල් කර තිබුණි.